මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 2484500, 011 2484600, 011 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk


දිනය / திகதி / Date: 2020.07.14

## ප්‍රවෘත්ති නිවේදනය

**<u>රජයේ කොන්ත්‍රාත් සහ සැපයුම්කරුවන්ට බැංකුවලින් ණය පහසුකම් ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරය මගින් 'හිග බිල්පත් නිරවුල් කිරීම තහවුරු කිරීමේ ලිපි' නිකුත් කෙරේ.</u>**

රජයේ විවිධ සංවර්ධන කටයුතුවලට සම්බන්ධ වී මෙතෙක් බිල්පත් ගෙවා අවසන් කර නොමැති ඉදිකිරීම් ඇතුළු අනෙකුත් ක්ෂේත්‍රවල රජයේ කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් වෙත බැංකු මගින් ණය පහසුකම් ලබා ගැනීම සඳහා, අදාළ බැංකු වෙත භාණ්ඩාගාරය මගින් 'හිග බිල්පත් නිරවුල් කිරීම තහවුරු කිරීමේ ලිපි' නිකුත් කිරීම ආරම්භ කර ඇත.

මෙම වැඩපිළිවෙළ යටතේ 2020 මැයි මස 31 වැනි දිනයට වාර්තාවී ඇති 2019 සහ 2020 වසරවලට අදාළ හිඟ මුදල්වලට අදාළව මෙම ලිපි නිකුත් කිරීමට සිදු කෙරේ.

ඒ අනුව අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් නම් කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා පමණක් මෙම ලිපි නිකුත් කෙරෙන අතර අදාළ හිග මුදල් ගෙවීම සඳහා එසේ නම් කරනු ලැබූ වාණිජ බැංකුවේ කොන්ත්‍රාත්කරු නමින් විශේෂ ගිණුමක් ආරම්භ කළ යුතු ය.

හිග මුදල් ගෙවීමට අවශ්‍ය මුදල් වරින් වර භාණ්ඩාගාරය මගින් අදාල සේවාලාභී අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව වෙත නිදහස් කිරීමට කටයුතු කරනු ලබන අතර එම අරමුදල් භාවිත කරමින් අදාල අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ නමින්වූ විශේෂ බැංකු ගිණුම හරහා පමණක් අදාල බිල්පත් නිරවුල් කිරීම සිදු කරනු ලැබේ. 'ආර්ථික පුනර්ජීවනය සඳහා පහසුකම් සැලසීම' මැයෙන් 2020 ජූනි මස 06 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයට අනුව මෙම පහසුකම් සැලසීම ක්‍රියාත්මක ය.

එම්.ජී. ජයතිස්ස
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ